# නැණපත

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ත්‍රෛමාසික පුවත් හසුන

Office of the Prime Minister | ICTA ideas actioned | e Sri Lanka smart people smart island

4 කලාපය - 2006 ජූලි


## රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණය තුළින්

## විසි එක්වෙනි සියවසේ අභියෝග සඳහා අපේ රාජ්‍ය අංශය සූදානම් කෙරේ



රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව ඇතැයි අග්‍රාමාත්‍ය ලේකම් ලලිත් වීරතුංග මහතා පවසයි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය තුළින් වඩාත් රාජ්‍ය සේවාවක් සහ කඩිනම් පුරවැසි සේවාවන් ලබාදීම එමඟින් රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම බව ප්‍රධාන නවකරණ නිලධාරීන්ගේ ජාතික සම්මන්ත්‍රණය අමතමින් ලලිත් වීරතුංග මහතා ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ මෙහෙයවීමෙන් පසුගියදා කොළඹදී පැවති මෙම සම්මන්ත්‍රණයට රාජ්‍ය සේවයේ ප්‍රධාන නවකරණ නිලධාරීහු විශාල පිරිසක් සහභාගී වූහ.

**ඉ- රාජ්‍යය යනු කුමක්ද?**

අංකිත යුගයේ දියුණුවත් සමඟම ලෝකයේ බොහෝ රටවල් සිය පුරවැසි සේවාවන් ලබාදීමේ ක්‍රමෝපායයන් වෙනස් කර තිබේ. විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික සහ අංකිත උපාංග භාවිතය තුළින් එම පුරවැසි සේවා කාර්යක්ෂමව සහ පහසු ලෙස ලබාදීමට හැකියාව ලැබී ඇත. ඉ - රාජ්‍යය යනු විශාල සවිබල ගන්වන ලද රාජ්‍ය සේවයයි. විශේෂයෙන්ම නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් පුරවැසි සේවා ලබාදීම මෙන්ම රාජ්‍ය අංශයේ කළමනාකරණ කටයුතු සඳහා නවීන තාක්ෂණය භාවිත කිරීම ඉ - රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයි.

**රාජ්‍යයන්ට වෙනස් වීමට අවශ්‍යව ඇත්තේ ඇයි?**

පුරවැසි සේවා සැපයීමට රජයන් හට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම අද අත්‍යවශ්‍ය වී තිබේ. අතීතයේදී එවැනි සේවා සරල ක්‍රම මඟින් සැපයුන ද සංකීර්ණ සමාජයක් තුළ තවදුරටත් එවැනි යල්පැන ගිය ක්‍රම අනුගමනය කිරීම අර්ථ විරහිතය. මේ පිළිබඳ තවදුරටත් ප්‍රධාන නවකරණ නිලධාරී සම්මන්ත්‍රණයේදී වැඩිදුරටත් අදහස් දැක්වූ අග්‍රාමාත්‍ය ලේකම්වරයා මෙම සංකීර්ණ සමාජ අවශ්‍යතා සපුරාලීමට වෙනස්වීමට සූදානම් නොවන සියලුම නිලධාරීන් සහ ආයතන ජනතාවගෙන් ඈත් කිරීමට හේතු සම්පාදනය කරන බව පෙන්වා

02 පිටුවට ...

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික වැඩපිළිවෙල පිළිබඳ ග්‍රාමීය මට්ටමින් ජනතාව දැනුවත් කිරීම ඇරඹේ

**"තොරතුරු තාක්ෂණයෙන් ගැමි ආර්ථිකය සවිබල ගැන්වීම රජයේ අරමුණයි."**
**අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ**



"සෑම පුරවැසියෙකුටම කඩිනමින් තොරතුරු ලබාගැනීම සඳහා නිදහස් හා සමාන අවස්ථා ලබාදීමටත්, විවිධ ක්‍රම මඟින් අදහස් ප්‍රකාශ කිරීමට ඉඩකඩ සැලසීමටත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට හැකියාව ඇතැයි" අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පවසයි. "රජයේ අපේක්ෂාව වන්නේ ජනතාවගේ එම මූලික අයිතිවාසිකම් පුරමින් රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපකාරී කර ගැනීම බව" තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික වැඩසටහනේ ග්‍රාමීය දැනුවත් කිරීමේ වැඩපිළිවෙළ පසුගියදා මහියංගණයෙන් ආරම්භ කරමින් අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළේය.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික සංවර්ධන වැඩසටහන සහ, එහි වාසි පිළිබඳව සහ ගැමි ජනතාවට එමඟින් ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධයෙනුත් ඔවුන් දැනුවත් කිරීම කාලෝචිත බව අගමැතිවරයා පැවසීය. එමඟින් සැබෑ

03 පිටුවට ...

රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණය අළියින්...
01 පිටුවෙන්

ප්‍රශ්නය. 'ඉ- රාජ්‍යය යනු සාම්ප්‍රදායික රාජ්‍ය සේවය කාර්යක්ෂම, නවීන රාජ්‍ය සේවයක් බවට පත් කිරීමේ සංක්‍රාන්ති සමයයි. විශාල මධ්‍යගත රාජ්‍ය සේවාවක් වෙනුවට විවෘත සහ පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීමේ මහඟු අවස්ථාව දැන් උදා වී ඇතැයි අග්‍රාමාත්‍ය ලේකම්වරයා අවධාරණය කළේය.

**ප්‍රතිසංස්කරණ සිදුවන්නේ කෙසේද?**

රාජ්‍ය සේවා සරල ලෙස ස්වයංක්‍රීය උපකරණ පද්ධතියන් මගින් පාලනය කිරීමෙන් පමණක් මෙම ප්‍රතිසංස්කරණ පරිපූර්ණ කළ නොහැකිය. දැනට රාජ්‍ය අංශයේ කටයුතු සිදුකෙරෙන ආකාරය ප්‍රතිනිර්මාණය තුළින් පමණක් අදාළ ප්‍රතිසංස්කරණ ක්‍රමවත්ව සිදු කිරීමට හැකියාව ලැබෙයි. වෙනස් කිරීමට අවශ්‍ය ක්‍රියාදාමයන් පිළිබඳ අධ්‍යයනය කිරීමත් විකල්ප ක්‍රියා මාර්ග අත්හදා බැලීමත් තුළින් රාජ්‍ය සේවා කාර්යක්ෂමව ජනතාව වෙත ලබාදිය හැකිය. එහිදී විශේෂයෙන්ම අදාළ කටයුතු අනවශ්‍ය බාධාවලින් ඉවත් කිරීම වැදගත් වන අතරම විනිවිද භාවයකින් යුතුව රාජ්‍ය සේවා ලබාදීම ද අනිවාර්යය වේ. දැනට භාවිත කරන ක්‍රම පරිගණකගත කිරීම පමණක් ඒ අනුව රාජ්‍ය සේවා ප්‍රතිනිර්මාණය තුළ දී නොසෑහෙන බව විද්වතුන්ගේ මතයයි. මේ පිළිබඳ ප්‍රධාන නවකරණ නිලධාරි සම්මන්ත්‍රණයේදී වැඩිදුරටත් කරුණු පෙන්වා දුන් පරිපාලන ප්‍රතිසංස්කරණ කොමිසමේ ප්‍රධානී ධම්මික අමරසිංහ මහතා, දීර්ඝ සහ සංකීර්ණ රාජ්‍ය සේවා ක්‍රියාදාමයන් බොහෝවිට දූෂණය සඳහා හේතුවන්නක් විය හැකි බව ප්‍රකාශ කළේය.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ ශ්‍රී ලංකා රජයේ වත්මන් ස්ථාවරය කුමක්ද?**

මෙහිදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවාවන් අන්ත දෙකක පසුවන බව පෙනේ. එක් පසෙකින් විදේශ ගමන් බලපත්‍ර පැය මින් වැනි කාලයකදී ලබාදීමට කටයුතු කර ඇතත් බොහෝ රාජ්‍ය නිලධාරීන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ අඩු දැනුමකින් ඇති බව පෙනී වී තිබේ. එක් ලේඛනයක් ලබාගැනීමට පුරවැසියෙකුට අවස්ථා ගණනාවක් විවිධ ස්ථානවලට යමින් සිය කාලය සහ ධනය වැය කිරීමට සිදුවීම තුළින් මේ බව තහවුරු වේ. ඒ අනුව මෙවැනි අනවශ්‍ය ලේඛන නිකුත් කිරීම සඳහා මධ්‍යගත ස්වයංක්‍රීය දත්ත පද්ධතියක් මෙන්ම ක්‍රියාදාමයක් තිබීම අනිවාර්යය වී තිබේ.

**තොරතුරු යුගය වෙත රාජ්‍ය අංශය රැගෙන යාමට අප සැලසුම් කර ඇත්තේ කෙසේද?**

**1. ඉ - හැකියාකාරක ස්ථාපිත කිරීම**

ඉ - රාජ්‍යයක් සඳහා අවශ්‍ය කරන කටයුතු සංවිධාන කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් විවිධ ව්‍යාපෘති දියත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙහි අරමුණයි. විශේෂයෙන් පරිගණක පහසුකම් සඳහා, යටිතල පහසුකම් සහ ක්‍රමවත් කටයුතු සංවිධාන කිරීම ඒ යටතට ගැනේ. විශේෂයෙන් Lakgovnet හරහා රාජ්‍ය ආයතන ප්‍රවීල් සන්නිවේදන ජාලයකට සම්බන්ධ කිරීමට සැලසුම් කර තිබේ. එමෙන්ම මුදල් ප්‍රවාහ කටයුතු සඳහා e-gate නිර්මාණය කිරීමටත් ආරක්ෂක ප්‍රමිති සහ නිර්මිතීන් සකස් කිරීමටත් ජනගහනය ලේඛනය මගින් මධ්‍යගත පුරවැසි දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමටත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය පියවර ගෙන තිබේ.

**2. ඉ - සේවා**

සමාජය වෙත දැඩි බලපෑමක් කළ හැකි ඉ - සේවා කිහිපයක් දැනටමත් මෙරට තුළ දී සඳහා ගැනීමට හැකි වී ඇත. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, විදේශ රැකියා, විශ්‍රාම වැටුප්. සේවක අර්ථසාධක අරමුදල් වැනි සේවා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් සවිබල ගැන්වීමට රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණ වැඩසටහන යටතේ සැලසුම් කර තිබේ.

**3. ප්‍රධාන නවකරණ නිලධාරි සංසදය**

ඉ - රාජ්‍යය ගොඩනැගීම සඳහා වැදගත් මෙහෙවරක් ඉටු කරනු පිණිස මෙම ප්‍රධාන නවකරණ නිලධාරි සංසදය පිහිටි. ඉ - ශ්‍රී ලංකා ව්‍යාපෘතිය ආරම්භයේදීම රාජ්‍ය සේවයේ නිලධාරීන් 600 ගෙන් සමන්විත මෙම සංසදය නිර්මාණය කෙරිණි. ඔවුන් සතු නායකත්ව හැකියාවන් සහ නව අත්හදා බැලීම් සිදු කිරීමට ඇති කැමැත්ත ඉ - රාජ්‍යයක් ගොඩනැගීමේ කාර්යයේදී වඩා වැදගත් වනු ඇත.

**4. රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථානය**

සියලුම රාජ්‍ය සේවා සම්බන්ධයෙන් තොරතුරු ලබාදෙන කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් පිහිටුවීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය කටයුතු කරමින් සිටී. ලබන වසරේ අප්‍රේල් මස සිට ඕනෑම පුරවැසියෙකුට පැමිණීමෙන් ඕනෑම රාජ්‍ය සේවාවක් සම්බන්ධයෙන් තොරතුරු මෙම මධ්‍යස්ථානය මගින් ලබාගත හැකිය.

**මෙල්නි ජීන්ස්**
වැඩසටහන් කළමනාකාරිණී

**මාධ්‍යවේදීන් සඳහා තොරතුරු තාක්ෂණය පළමු පාඨමාලාව මැයි මස ඇරඹේ**

වෘත්තීය මාධ්‍යවේදීන් සඳහා පවත්වන ජාතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව මැයි මාසයේදී ආරම්භ කිරීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය කටයුතු යොදා තිබේ. ආරම්භක කණ්ඩායමට වෘත්තීය මාධ්‍යවේදීන් විසි දෙදෙනෙකු තෝරාගෙන ඇත. අදාළ පාඨමාලාව පැවැත්වීම සඳහා මෙරට සෑම මාධ්‍ය ආයතනයකින්ම පසේ මාධ්‍යවේදීන් දෙසිය දෙදෙනෙකු සිය අයදුම්පත් නියෝජිතායතනය වෙත ඉදිරිපත් කර තිබිණ. ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ සොයා බැලීමෙන් පසුව වසරකට මාධ්‍යවේදීන් සිය දෙදෙනෙකු සඳහා වෘත්තීය කේන්ද්‍රීය තොරතුරු තාක්ෂණ පාඨමාලාවන් පැවැත්වීමට පිළිවෙළ යොදා ඇත. ඉදිරියේදී ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා ද සිය වෘත්තීය කටයුතු වඩාත් ලෙස සිදු කිරීමට උපකාරී වන අන්දමින් තොරතුරු තාක්ෂණ පාඨමාලාවන් සංවිධානය කිරීමට සැලසුම් කර තිබේ.



## නව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කෙරේ

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ නව අධ්‍යක්ෂ මණ්ඩලය පසුගියදා පත් කෙරිණ. අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නිර්දේශය අනුව නියෝජිතායතනයේ නව සභාපතිවරයා ලෙස විද්‍යාජ්‍යෝති මහාචාර්ය වී. කේ. සමරනායක මහතා පත් කොට ඇත. දීර්ඝ කාලයක් මෙරට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කටයුතු කළ මහාචාර්යවරයා ශ්‍රී ලංකාවේ පරිගණක ක්ෂේත්‍රයට විශාල මෙහෙවරක් සිදු කළ පුද්ගලයෙකි. නියෝජ්‍ය සභාපතිවරයා ලෙස නිහාල් රොද්‍රිගු මහතා පත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙසු සාමාජිකයන් වන්නේ මිල්ද් හත්තොටුව, ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු, සිඹිර රාජපක්ෂ, නිහාල් ජේවගේ, ජයන්ත විකුමසිංහ සහ අරුණ අමරසේකර යන මහත්වරුන්ය.




# නැණසල තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සාර්ථකව ඉදිරියට...





තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ගම්වලට ගෙනයාමේ අරමුණින් ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවන නැණසල මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කෙරෙන බව එහි ව්‍යාපෘති කළමනාකාරිණී දිල් ප්‍රියරත්න මහත්මිය පවසයි. ප්‍රථම අධ්‍යයනයකින් පසුව නැණසල මධ්‍යස්ථාන රාශියක් දිවයින පුරා පිහිටුවීමට හැකිවී ඇතැයි ඇය ප්‍රකාශ කළාය. ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රදේශ පහක නැණසල මධ්‍යස්ථාන පසුගියදා විවෘත කෙරිණි. හිඳුම්බ, වැලිමඩ, ගේලේගමවත්ත, කොස්ලන්ද සහ බණ්ඩාරවෙල ප්‍රදේශවල නැණසල තොරතුරු මධ්‍යස්ථාන සිය සේවා ජනතාවට ලබාදීම දැන් ආරම්භ කර ඇතැයි වාර්තා වේ. එම සියලු මධ්‍යස්ථාන වෙත චන්ද්‍රිකා තාක්ෂණය භාවිත කරමින් අන්තර්ජාල සහ දුරකථන පහසුකම් ලබාදී තිබේ.

මේ අතර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැණසල මධ්‍යස්ථාන පහක් ලබාදීම විවෘත කිරීමට කටයුතු යොදා ඇත.

සුනාමි ඛේදවාචකයෙන් විපතට පත් ජනයා වෙසෙන කඳවුරු පහළොවක නැණසල මධ්‍යස්ථාන පිහිටුවීමට ද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට හැකි වී තිබේ. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට නවීන තාක්ෂණය භාවිත කරමින් සන්නිවේදන පහසුකම් සැපයීම නැණසල මධ්‍යස්ථානවලින් සිදු කෙරේ.



# විශ්ව ගම්මානයට මහවිලච්චියෙන් දොරටුවක්.....



1998 දී ස්ථාපිත කරන ලද හොරයිසන් ලංකා පදනම මගින් ආරම්භ කරනු ලැබූ මහවිලච්චිය තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිය සඳහා පූර්ණ අනුග්‍රහය ලබාදීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය පියවර ගෙන තිබේ. ඒ අනුව පරිගණක අධ්‍යාපනය සහ තොරතුරු තාක්ෂණය හැදෑරීම සඳහා ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීමට ඉක්මනින් කටයුතු කර ඇතැයි ව්‍යාපෘතියේ කළමනාකරු ගෝඩන් වෙන්ෆර්ඩ් මහතා පවසයි. මහවිලච්චිය ග්‍රාමයේ ක්‍රියාත්මක Digital Butterflies හෙවත් "ඩිජිටල් සමනළුන්" ව්‍යාපෘතිය යටතේ සෑම නිවසකටම පරිගණකයක් ලබාදීමට සැලසුම් කර තිබේ. දැනටමත් නිවෙස් සියයකට පරිගණක ලබාදී ඇති අතර, එය එම ප්‍රදේශයේ පදිංචි පවුල් සංඛ්‍යාව ද අභිබවා යන්නකි.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අනුග්‍රහයෙන් ප්‍රධාන තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් මහවිලච්චිය ග්‍රාමයේ පිහිටුවීම දැන් ආරම්භ වී ඇත. පැය විසි හතර පුරා අන්තර්ජාල පහසුකම් එම ගම්වාසීන්ට සැපයීමට එම මධ්‍යස්ථානය මගින් හැකිවනු ඇතැයි විශ්වාස කෙරේ. ඒ අනුව මහවිලච්චිය ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉ- ගම්මානය බවට පත්වනු ඇතැයි ගෝඩන් වෙන්ෆර්ඩ් මහතා පැවසීය. එමගින් මහවිලච්චිය ගම්වාසීන්ට විශ්ව ගම්මානය වෙත පිවිසීමට ද හැකිවනු ඇත.

01 පිටුවෙන්...

ජනතා අවශ්‍යතා හඳුනාගනිමින්, බහුතරයකට ප්‍රයෝජනවත් අන්දමින් හා විවිධ භාවිතයන් යුතුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික සංවර්ධන ව්‍යාපෘතිය රට තුළ ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙන බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අවධාරණය කළේය.

මහියංගණ ජාතික පාසල් ක්‍රීඩාංගණයේදී පැවති මෙම දැනුවත් කිරීමේ වැඩසටහනේදී ජංගම තොරතුරු තාක්ෂණ ප්‍රදර්ශනයක් ද පැවැත්විණ. ඊට අමතරව මහියංගණ පුරා ප්‍රමුඛ ආයතනයේදී "නැණසල" තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ද අගමැතිවරයා අතින් විවෘත කෙරිණි. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී පෞද්ගලික සමාගම් වන ඩයලොග් ජී එස් එම් සහ ඒ. ජී. හවුස් යන ආයතන ද මෙම ග්‍රාමීය ජනයා දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ක්‍රියාකාරීව දායක විය. මසකට වරක් එක් ප්‍රදේශයක මෙවැනි දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සූදානම් වේ. ඒ සඳහා පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ ආයතන ද සම්බන්ධ කර ගැනීමට ප්‍රයත්නයක් සැලසුම් කර තිබේ.